UNITED NATIONS
SRI LANKA

**එකසත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකවරියගේ වෙසක් දින පණිවුඩය**.

වෙසක් දින සමරන සැමට, එක්සත් ජාතීන්ගේ මහ ලේකම් වරයා සහ ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් මගේ සුභ පැතුම්.

වෛරයෙන් වෛරය නොසන්සිඳේ, අවෛරයෙනම් වෛරය සන්සිඳේ"

ලංකාව මෙන්ම මුළු ලොවම අර්බුද් රැසකට මුහුණ දෙන මෙම සමයේ, ධම්මපදයේ මෙම ගාතාව ඔබට මග පෙනවනු ඇතැයි සිතමි.

කීර්තිමත් ශ්‍රී ලාංකිකයෙකු වන, හිටපු විදේශ අමාත්‍ය ගරු ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ යෝජනාවකට අනුව 1999 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ දී වෙසක් උත්සවය සැමරීමේ දිනයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

දයානුකම්පාවෙන්, ගෞරවයෙන් සහ අවබෝධයෙන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝකය ඔබ සමඟ සිටින අතර, ඔබගේ ඔරොත්තු දීමේ හැකියාව අපි අගය කරමින් , වත්මන් අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ඔබ යන ගමනේදී අනාගතය පිළිබඳ බලාපොරොත්තු සහගත වෙමු.

බුදුවරුන් ගේ අනුශාසනය වන්නේ සියලු පව් නොකිරීමද, කුසල් දියුණු කර ගැනීමද, සිය සිත පිරිසිදු කිරීමද වේ. වත්මන් අභියෝග ජයගත හැක්කේ ද දයාවෙන් සහ යහපත් ඡේතනාවෙන්ම පමණි